**බදු අභියාචනා කොමිෂන් සභාව - 2017**

**--------------------------------------------**

බදු අභියාචනා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------------**

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------------

මෙම බදු අභියාචනා කොමිෂන් සභාව 2011 අප්‍රේල් 23 දින පිහිටුවා ඇති අතර 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතේ 2 ඡේදය අනුව යම් බදු ගාස්තු හෝ අය කිරීම්, පැනවීම හා අදාළ කාරනා සම්බන්ධයෙන් වන සියලු අභියාචනා විභාග කිරීමේ වගකීම එම කොමිෂන් සභාව වෙත පැවරී තිබුණි. කෙසේ වුව ද, කොමිෂන් සභාව ස්ථාපිත කර ඇති පනත තුල කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ විගණනය සම්බන්ධයෙන් වන විධිවිධාන ඇතුළත් ව නොතිබුණි. එහෙත් කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම**

**--------------------------------------------**

කොමිෂන් සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබුණ ද සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පදනම් කර ගන්නා  ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි. කොමිෂන් සභාව පවත්වා ගෙන යාම සඳහා භාණ්ඩාගාරයේ  අංක 102 වැය ශීර්ෂයේ වැඩසටහන් අංක 1 හි ව්‍යාපෘති අංක 03 යටතේ පිළිවලින් රු.57,177,000 ක  හා රු.16,620,100 ක ශුද්ධ පුනරාවර්තන හා ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන යොදා ගෙන කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.55,494,611 ක පුනරාවර්තන වියදම් හා රු.5,725,389 ක ප්‍රාග්ධන වියදම් මාසික ගිණුම් සාරාංශ මඟින් යථෝක්ත ව්‍යාපෘතියේ වැය විෂයයන්ට හර කර මුදල් අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම යටතේ දක්වා තිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

--------------------------------------

කොමිෂන් සභාව විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 3,844,863 |
| ජංගම වත්කම් | 95,330,292 |
| මුළු වත්කම් | 99,175,155 |
| | |
| බැරකම් | |
| ජංගම බැරකම් | 90,469,357 |
| ජංගම නොවන බැරකම් | - |
| අතිරික්තය | 8,705,798 |
| මුළු බැරකම් | 99,175,155 |
| | |
| මුළු ආදායම (භාණ්ඩාගාර ලැබීම් රු.35,021,517 ඇතුළුව) | 35,065,517 |
| මුළු වියදම | 42,891,469 |
| ඌනතාවය | (7,825,952) |

## 2.4 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.396 (ඇ) | නිකුත් කළ නමුත් මාස 6 ක් ඉක්මවා මුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් නො වූ එකතුව රු.32,612 ක් වටිනා චෙක්පත් 3 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතින් බදු අභියාචනා කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණ අතර යම් බද්දක්, ගාස්තුවක් හෝ දණ්ඩනයක් හා අදාළ කාරණාවක් සම්බන්ධයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙනු ලබන යම් තීරණයකින් අතෘප්තියට පත් වන යම් තැනැත්තෙකුට කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. එසේ ලැබෙන අභියාචනා කොමිෂන් සභාව විසින් විභාග කර නිශ්චය කිරීම කළ යුතු ය. විගණනයට ලබාගත් තොරතුරු අනුව, 2011 වර්ෂයේ සිට 2018 ජුනි 30 දින දක්වා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ අභියාචනා සහ ඒවා නිශ්චය කිරීම පිළිබඳ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කොමිෂන් සභාව වෙත ලැබී ඇති වලංගු බදු අභියාචනා 504 ක් අතුරින් අභියාචනා 269 ක් 2018 ජූනි 30 දින වන විටද විභාග කර තීන්දු ලබා දී නොතිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, අභියාචනය විභාග කිරීම අවසන් කර තිබුණද නිශ්චය ලබා දීමට ඇති බදු අභියාචනා 48 ක් පැවති අතර ඊට අදාළ මතභේදකාරී බදු මුදලේ එකතුව රු.9,632,738,035 ක් විය.

(ඇ) අභියාචනය විභාග කිරීම ආරම්භ කර ඇති නමුත් නිම කර නොමැති බදු අභියාචනා 52 කට අදාළ මතභේදකාරී බදු මුදල රු.9,572,602,392 ක් විය.

(ඈ) 2018 ජූනි 30 දිනටත් විභාග කිරීම ආරම්භ කර නොමැති 2016,2017 හා 2018 වර්ෂයේ ලියාපදිංචි කර ඇති බදු අභියාචනා 283 ක් පමණ පැවති අතර ඒවායේ මතභේදයට තුඩු දී ඇති බදු මුදලේ එකතුව රු.27,108,767,237 ක් පමණ බව නිරීක්ෂණය විය.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2012 පෙබරවාරි 28 දින සිට 2017 දෙසැම්බර් 19 දින දක්වා වූ කාල සීමාවට අදාළ ව අවස්ථා 18 ක දී බදු අභියාචනාවලට නිශ්චය ලබා දීමෙන් පසු මුදල් බවට පත් කළ එකතුව රු.57,033,050 ක බැංකු ඇපකර මුදලක් 2017 දෙසැම්බර් 31 දින දක්වාත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

බදු අභියාචනා කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර බදු අභියාචනා කොමිෂන් සභාවේ ලේකම්ගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|
| (අ) ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොගැනීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | මුදල් බවට පත් කළ ඇපකර කාලීනව ප්‍රේෂණය නොකිරීම. |